ටීකාව

වි. කැඩ්රිමබන්ධු

කළ වැරදි හඳුනාගෙන එයින් නුවණැස ලබන්නට අත්වැලක්

ඊයේ නිපාත පදයකි. අද , හෙට යනුත් නිපාත පදයි. ඒවා වර නැගිය නොහැකි ය. ඊයෙන් - ඊයෙට, අදින් - අදට, හෙටින් - හෙටට යෙදුම් සදොස් ය

ජුනි සන්නස කළ වැරදි දෙස හැරී බැලීමක්

මින් ඉදිරියට ලිපි දොස් මෙන්ම යතුරු ලියන දොස් ද වෙන් වෙන් ව නොගෙන කැපී පෙනෙන දොස් වසා ම ගෙන පෙන්වා දීමට අදහස් කරමි. තම සිංහල භාෂා ඥානය දියුණු කර ගනු කැමති දුහුනන්ට ඒ තැන් බලා වරද තේරුම් ගෙන තම දැනුම දියුණු කර ගත හැකි ය.

ඇතැම් ලේඛකයන් ලියන බසින් පටන්ගෙන ලිපිය අතර මඟදී දොඩන බසටත් දොඩන බසින් පටන්ගෙන ලිපිය අතර මඟ දී ලියන බසටත් මාරු වන බව පෙනේ. එය එම ලිපියේ අගය අඩු වීමට හේතු වෙතැයි සිතමි.

ණ/න, ළ/ල ඡේදය සලකා ලියන ලේඛකයින් විශේෂයෙන් වර්ගාක්ෂරය ඉදිරියෙන් අදාල නාසිකාක්ෂරය ලිවීම අවශ්‍ය යැයි සිතමි. ථළ/ රල, කොළ/ කොල, ඇණ/ඇන, පණ/පන, වණ/වන යන තැන් වල පැටලීම් වලට වඩා ට, ඩ, ඩ, ඬ, ණ ඉදිරියෙන් න් ලිවීමත් ත, ථ, ද, ධ, න ඉදිරියෙන් ණ් ලිවීමත් කැපී පෙනෙන වැරදි බව තේරුම් ගැනීම මැනැවැයි සිතමි.

ලණ්ඩන් , ඇණ්ටන්, යනුවෙන් ලිවිය යුතු මේ නම් දෙක ලන්ඩන්, ඇන්ටන් යනුවෙන් ලිවීමට අවසර ඇති නම් ඒ අවසරයම අනෙක් තැන් වලටද තිබිය යුතු ය. එසේ වූ විට ණ/න ළ/ල ඛේදය මුළුමනින්ම ඉවත් වේ. කාලීන වශයෙන් එය සිදු විය යුතු පෙරළියක් යැයි සිතමි. එහෙත් තවම විශාරදයන්ගේ අනුමැතිය ඒ සඳහා ලැබී නැත.

ඇන්ටි- අන්කල්, ලෙන්චිනා, මන්ගර්, ඉන්ඩියන්, ඇලෙක්සැන්ඩර්, කන්ඩායම, සෙන්ටර්, පන්ඩිතාභය, බන්ධාර, මන්ඩලය, මෙබඳු පද වල න් වෙනුවට අනුස්වාරය "ං" යෙදූ විට සියලු දොස් දුරු වී යනු ඇත. ඬ්, ඬ්, ණ්, න්, ම් යන නාසික්‍යාක්ෂර 5 ම සඳහා අනුස්වාරය "ං" යෙදිය හැකි ය. එහෙත් එය කළ හැක්කේ වර්ගාක්ෂරයක් ඉදිරියෙන් ඇති විටයි.

1 ඬ් -	ලඬ්කා ලංකා	අඬ්ග -	අංග
2 ඬ්ද් -	පඬ්ඩම -	පංචම	
3 ණ් -	ෆැණ්ටා -	ෆැංටා	මඬ්ජුල - මංජුල
4 න් -	පින්තාලිය -	පිංතාලිය	දණ්ඩ - දංඩ
5 ම් -	ගම්පළ -	ගංපළ	පන්දම - පංදම
			කම්බිය - කංබිය

මේ "ං" යෙදුණු හැම පදයක් ම කියවන විට ඉබේම අදාල නාසික්‍යාක්ෂරය එතැනට එයි. තම හඬ ද නංවයි. එහෙත් කැන් - වන්, ලන් - ඩන් යනුවෙන් පද දෙකක් හැරීයට මිස දිව දත් වල ගාවා නඟන "න්" හඬට පසු ව ට, ඩ කියවීම ඉතා දුෂ්කර ය. දිව මුදුනේ ගාවා ණ්, ළ් හඬේත්, දිව දත් වල ගාවා (තෙරපා) න්/ල් හඬේත් වෙනස ඉගෙන ගන්න.
නොන්නො නෝනා ගේත් ණොණ්ණො ණෝණා ගේත් වෙනසද ඉගෙන ගන්න.

පියාණ, පුතාණු, දියණි යන පද හැඳි ඇත්තේ පිලිවෙලින් ආණ, අණු, අණි යන ප්‍රත්‍ය එකතුමෙන්. එවිට ඒ පද බහු වචන වේ. ඒවා යලි ඒක වචන කළ නොහැකි ය.

පියාණෝ/ සිටාණෝ) පියාණ/ සිටාණ) බණ අසති.
පුතාණුවෝ/ මුත්තාණුවෝ) පුතාණු/මුත්තාණු කෙනෙක්) බණ අසති.
දියණියෝ/ මෑණියෝ) දියණි/ මෑණි) බණ අසති.
එහෙත් කඩර හෙග්ග වත්
පියාණ/ සිටාණ) බණ අසයි
පුතාණුව/ මිත්තණුව) බණ අසයි.
දියණිය/ මෑණිය) බණ අසයි යනුවෙන් කිව නොහැකි ය.

1. ලියා දක්වන වගයි කතු වැකිය ඉතා උසස් කාලෝචිත ලියවිල්ලකි. එහි ගිරා පෝකත යන්නට පණු කෑල්ලකුත් බෙහෙතක් යන්නට ඊරෙක ටිකකුත් (පදයන්) එක් උණානං කියලා වැඩක් නෑ..

2. අලි කෙළි ඉතා උසස් ලිපියකි. එහි කෙස්ටිලින් රොඩ්වේල් නමැති පර්යේෂකයෙකුට පෙනී ගියේ ය. ‍ඌ්පඅරුෂ ලිංග) රෝඩ්වේල් නිරීක්ෂණය කළා ය (ස්ත්‍රී ලිංග) යන වාක්‍ය වල අවුලක් සිදු වී ඇත.

3. එළවන සුළු - එළවන සුලු විය යුතු ය (බිය සුලු, බිඳෙන සුලු,)
මුළින් - මුලින් විය යුතු ය. (මුල් ඉන්)
කළින් - කලින් විය යුතු ය. (කල් ඉන්)
ළඳ - ලඳ
ළඳ යනු නොමේරූ යන්නයි.
ලඳ යනු ලිය යන්නයි.
ළඳ ලඳ - ළාබාල අඟන

4. පාත්‍රයන්තර ප්‍රජාවද අසමත් වී සිටී යන්න සිටිති විය යුතු ය.
මාන අය්තීන් ය යන්න අය්තිහු විය යුතු ය.
දෙනෙකු විසටිනාමයේ ද සිටී යන වැකිය දෙදෙනෙක් ,,,,, සිටිති විය යුතු ය.

5. දෙමව්පියන් උනන්දු වූ හ යන වැකිය දෙමාපියෝ විය යුතු ය.
සිහිපත් කර ගමු යන්න ගහිමු විය යුතු ය. (ගන් ධාතුව වර නැගෙන්නේ ගහිමි, ගනුමු, ගතිමි, ගතුමු කියාය. ගතුමු යන්න ගන්මු, ගතිමු යනුවෙනුත් ගතුමු යන්න ගතිමු, ගන්මු, ගමිමු යනුවෙනුත් වෙනස් වෙතත් ගමු යන පදයක් නොසැදේ.

6 ඇමතිවරයකුද විය යන්න ඇමතිවරයෙක් ද විය යුතු ය.

7 ළමයින්ලෑ අම්මාට කරන ආයාචනය සිත්ගන්නා සුලු පබඳකි. පිරිතත් වළිවැටත් රැක්ම සඳහා සිත තදින් මෙහෙයවීම නිසා සිදුවූ වැරදි කීපයක් එහි දක්නට ලැබේ. ඉඳුන්, බිලිඳුන්, කිවිඳුන් අතින් වන වැරදි ලුහු කොට සිතිම අපේ සිරිතයි. මඳිදු අර්ථයෙන් මඳිදා යනුවෙනුත් නැතිද අර්ථයෙන් නැතිදා යනුවෙනුත් යෙදීම නොසඳහා හරිමි. අපට හුරු කර කාර බැඳීමය. කාර බැඳීම යන ව්‍යවහාරයක් ඇද්දැයි නොදැනිමි.
ගත වුනා, මෙලවුනා, පිරුනත්, ගුලි වී, ඇතුලේ, යලිත් යන පද වල ඇති සියලු න/ල අකුරු ණ/ල විය යුතු ය.
තුරුළු වී, ළඳේ, බැළුමට, පිණ, යන පද වල ණ/ළ අකුරු න/ල විය යුතු සේත් පෙනේ.
දරුවන් අකුරු කරති යන වැකියේ දරුවන් යන්න දරුවෝ විය යුතු ය.
ළඳේ මා මේ දුක හැමදා මොකට උතුලන් ඉන්න ද යන වැකියේ ළඳ යන්න ලඳ වී යුතු ය. උක්තය මම වී ආඛ්‍යාතය ඉන්නෙමි ද විය යුතු ය.

8 තේරවිලි තේරවිලි විය යුතු ය.
(තෝරව ඉලි - තෝරවිලි - තේරවිලි වේ)
පල කිරීම, සියළු, මඟළු, අළුත්, බිළි, පුර ළමින් යන තැන් වල දන්තජ සහ මූර්ධජ මාරු විය යුතු ය.
දළු නිවැරදි වුවත් දළුල, දළුලක් වැනි ව්‍යවහාර යට ඉඩ දිය යුතු නිසා ගිහි දලු නිවැරදි යයි සිතමි.

9 ඊයේ නිපාත පදයකි. අද , හෙට යනුත් නිපාත පදයි. ඒවා වර නැගිය නොහැකි ය. ඊයෙන් - ඊයෙට, අදින් - අදට, හෙටින් - හෙටට සඳොස් යෙදුම්කි. ඊයේ/අද/හෙට දිනයෙන් - දිනයට නිවැරදි ඊතියයි.

10 ලොකු ළුණු - රට ළුණු (බී ළුණු) වෙනුවට ආදේශ වූ ඡේශපාලන ළුණු විශේෂයකි. ලොකු ළුණු ගෝණියේ පොඩි ළුණු තෝරා කුඩයට දැමීය හැකි ය. රට උළු. රට ඉඳි. රට හරක්, රට සල්ලි, රට කෑම රට එළවළු යන ව්‍යවහාරයක් අපේ රටේ ඇත. මාවී/ මා වවුල්ලු/ මා දං/ මහ නාරං/ පොල් අඹ/ ඇස් තෝර/ ඇත් දෙමට ආදී ව්‍යවහාරය අනුව මහ ළුණු වඩා ගැළපේ. ■

8 පිටෙන් ඉතිරිය

අලි ඇතුන් බලන්න කවුඩුල්ලට එන්න
20 වන සියවස ආරම්භයේ දී ශ්‍රී ලංකාවෙන් 70%ක් ම වැසී තිබුණේ වනාන්තරවලිනි. එවකට, එනම් 1900 ආරම්භ වන කාලයේ දී මේ වන ගහණය නිසා ම ඊට සාපේක්ෂව වට පුරා ම ව්‍යාප්ත ව ගිය අලි ඇතුන් ගහණයක් ද ශ්‍රී ලංකාව සතු විය. ඒ වන විටත් ඕලාන්ද ආණ්ඩුකාරයන් විසින් නැවී (ඩල්ග) ගණනට තැබූ ලබා දෙමින් මහා පරිමාණයෙන් මෙරට අලි ඇතුන් දඩය-ක්කරුවන් ලවා මරා තිබුණ ද 1900 වන විටත් සැළකිය යුතු අලි ඇතුන් සංඛ්‍යාවක් මෙරට වාසය කළහා. විශේෂයෙන් ම මධ්‍යම කඳුකරයේ හඳවත වන මඟවළිය (ගෝරිවන් තැන්න) වනෝද්‍යානය තුළ ද 20 වන සියවස ආරම්භයේ දී අලිඇතුන් වාසය කළ බවත් පහළින් ඇති වස්ගමුව වැනි වනෝද්‍යානවල සිට පවා 'කිලූ' නැමැති ගාකය කෑමට හෝරිටන්තැන්නට අලි ඇතුන් පැමිණි බවත් වාර්තාව සඳහන් වේ.
20 වන සියවස ආරම්භයේ දී ශ්‍රී ලංකාව තුළ මෙතරම් ම අලි ඇතුන් ව්‍යාප්තියක් පැවැතිය ද ඉතාම ඉක්මනින් පසුගිය සියවස තුළ සිදු වූ රෙගවත් මිනිස් ජනාවාස ව්‍යාපෘතිය හේතුවෙන් වනගහණය බලා සිටිද්දී අඩුවන්නට විය. එම නිසා ම වාසස්ථාන සහ ආහාර අර්බුදයට ද ඒ වේගයෙන් ම මුහුණ දුන් අලි ඇතුන් ද ඉතාම ඉක්මණින් ම මේ ඛිමීන් වඳවී යාම ආරම්භ විය. මෙම තත්වය හේතුකොට ගෙන මේ වන විට ශ්‍රී ලංකාවේ සමස්ථ භූමි ප්‍රමාණයෙන් වනාන්තර සඳහා වෙන්ව ඇත්තේ 20% කට ආසන්න සුළු භූමි ප්‍රමාණයක් පමණකි. එම සීමිත භූමි ප්‍රමාණයෙනුත් අලි ඇතුන් වාසය කරන වනජීවී රක්ෂිත සඳහා වෙන්ව ඇත්තේ සමස්ථ භූමි ප්‍රමාණයෙන් 14% කි. මෙම 14% ක අරක්ෂිත භූමි ප්‍රමාණය රටපුරා වෙන්වෙන් ව පිහිටා ඇති ආකාරය අනුව ජාතික වනෝද්‍යාන 18 ක් වශයෙන් බෙදා නම් කර ඇත.
වනෝද්‍යාන 18 අතරිනුත් මේ වන විට ඉතාම සීමිත සංඛ්‍යාවකට සීමාවී ඇති වල් අලි ඇතුන් දැකබලා ගැනීමට ප්‍රචලිත වනෝද්‍යාන කිහිපයක් වෙයි. ඒ අතරින් ප්‍රධානම තැනක් ගන්නේ උඩවලවව ජාතික වනෝද්‍යානයයි. එකවර වල් අලි 130 - 150 ක පමණ විශාල රංචුවක් දැකබලා ගත හැකි උඩවලව ජාතික වනෝද්‍යානය මේ හේතුව නිසා ම සංචාරකයන්ගේ ද පාරාදීසයක් බවට පත් වී ඇත. උඩවලවට අමතරව හිදපාසේ ගැවසෙන වල් අලින් දැක බලාගැනීමට ඉතාම යෝග්‍ය වනෝද්‍යාන වශයෙන් ලාහුගල, සෝමාවතිය සහ මීන්නේරිය හඳුන්වා දිය හැකි ය. යාල (රුහුණු) කුමන,
වීල්පත්තුව, වස්ගමුව, මාදුරුඔය, ගල්ඔය, ලුණුගම්වෙහෙර සහ බුන්දල වැනි ජාතික වනෝද්‍යානවල අලි ඇත්තු සැලකිය යුතු ප්‍රමාණයක් වාසය කරති. මෙහි සඳහන් කළ සියලු ම ජාතික

වනෝද්‍යානවලට අමතරව වසරේ වැඩි කාලයක් පුරා වල් අලින් දැක බලා ගත හැකි තවත් මනරම් වනෝද්‍යානයක් වේ. එය නමින් කවුඩුල්ල ජාතික වනෝද්‍යානයයි.
කවුඩුල්ල ජාතික වනෝද්‍යානය පිහිටා ඇත්තේ උතුරුමැද ප්‍රළාතට අයත් පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ය.
පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිතුරන්කොගොඩ හා මැදිරිගිරිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකට අයත්ව පිහිටා ඇති ඉපැරණි කවුඩුල්ල වැව ආශ්‍රිත වනාන්තර ප්‍රදේශය කවුඩුල්ල ජාතික වනෝද්‍යානය ලෙසින් නම්කර ඇත. කවුඩුල්ල වැව ආශ්‍රිතව පිහිටි වනාන්තරය කලක් තිස්සේ ම පැවැතුණේ අභයභූමියක් වශයෙනි. මෙම භූමි භාගය ජාතික වනෝද්‍යානයක් ලෙසින් නම් කරන ලදදේ 2002 වර්ෂයේ දී ය. ඊට අයත්වන භූමි ප්‍රමාණය හෙක්ටයාර 6900 කි. දැනට මෙරට පවතින අනෙකුත් ජාතික වනෝද්‍යාන සහ වනජීවී රක්ෂිත ලෙසට ප්‍රකට භූමිභාගයන්ට පොදු ලක්ෂණයක් මෙම කවුඩුල්ල ජාතික වනෝද්‍යානයට ද වැදගත්කමක් සපයනු ලබයි. එනම් පැරණි රජ දරුවන් විසින් කරන ලද දැවැන්න වැව් අතරින් විශාලම කලාපයේ ජනයාට මෙන් ම වන සතුන්ට ද දියවර සැපයූ මහ වැවක් කවුඩුල්ල වනෝද්‍යානයට ද අයත්ව තිබීමයි. කවුඩුල්ල නම් මෙම දැවැන්න වාරි නිර්මාණය කරවන ලද්දේ මීට සියවස් 17 කට පමණ පෙර මහා මීන්නේරිය වැව නිර්මාණය කර මීන්නේරිය දෙවියන් නමින් ඉතිහාස ගත වූ මහසෙන් රජු විසිනි. කවුඩුල්ල වැව මහසෙන් රජුගේ ම නිර්මාණයක් ලෙසින් ඉතිහාසයේ බොහෝ තැන්වල සඳහන්ව තිබුණ ද එය මහසෙන් රජුගේ සොයුරිය වූ බිසෝ බණ්ඩාර කුමරිය විසින් නිර්මාණය කරවන ලද්දක්ය යනුවෙන් ජනප්‍රවාදවල සඳහන් වෙයි. මේ ජනප්‍රවාදවලට අනුව බිසෝ බණ්ඩාර කුමරිය මෙම වැව සාදා හිම කර ඇත්තේ තම සහෝදරයා (මහසෙන්) නැඩිලියක් (මීන්නේරිය වැව) තනද්දී තමා කොරහක් තැනූ බවට උදම් අනමිනි. අක්කර අඩි එක්ලක්ෂ ■